# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# පුරප්පාඩු

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. කළමනාකරණ සහකාර
## (III ශ්‍රේණිය) (පුරප්පාඩු සංඛ්‍යාව 01)

සුදුසුකම් :
(1) අ.පො.ස (සා.පෙ) විභාගය සිංහල භාෂාව / දෙමළ භාෂාව, ඉංග්‍රිසිභාෂාව / ඉංග්‍රිසි සාහිත්‍ය සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සමාර්ථ (C) සහිතව විෂයන් හයක් (06) එකවරක දී සමත්ව තිබීම.

සහ
(2) අ.පො.ස (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)
(පරණ විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනක් එකවර සමත් වීම ප්‍රමාණවත් වේ.)
පහත සඳහන් සුදුසුකම් ඇති අය සඳහා විශේෂත්වයක් දක්වනු ලැබේ.
(a) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදවුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ
(b) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්දක් තිබීම.
(c) තොරතුරු තාක්ෂණ සන්නිවේදනයේ වෙබ් නිර්මාණය පිළිබඳ මූලික දැනුමක්/ රැකියා පළපුරුද්දක් තිබීම.

සටහන :-
(a) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(b) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.
(c) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

වැටුප් ක්‍රමය :
U-MN 1 (III) - රු. 49,475 - 17 x 540 - 58,655 (මාසික)
(ඉහත වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 අනුව වැටුප් පරිමාණය වේ. මූලික වැටුපට අමතරව රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ)

බඳවා ගනු ලබන ආකාරය :
ලිඛිත පරීක්ෂණයකින් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයකින් (ලකුණු 25%)

ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයයන්ගෙන් සමන්විතය.
- සිංහල / දෙමළ හා ඉංග්‍රිසි භාෂා දැනුම
- බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම
- පරිගණක දැනුම

## 02. පුස්තකාල සහායක
## (III ශ්‍රේණිය)

සුදුසුකම් :
1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විභාගය සම්මාන සමාර්ථ (C) දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත් විම.

වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

සටහන : -
(a) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(b) තනතුරේ රාජකාරී මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(c) විශිෂ්ට සදාචාර සම්පන්න චරිතයකින් යුක්ත විය යුතුය.

වැටුප් ක්‍රමය :
U-PL 1 (III) රු. 42,775 - 16 x 450 - 49,975 (මාසිකව)
(ඉහත වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 අනුව වැටුප් පරිමාණය වේ. මූලික වැටුපට අමතරව රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ)

බඳවා ගනු ලබන ආකාරය :
වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින්

අමතර කුසලතා :
- ඉංග්‍රිසි භාෂාව පිළිබඳ ප්‍රමාණාත්මක දැනුමක්
- තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රමාණාත්මක දැනුමක්

## 03. වැඩ සහායක
## (III ශ්‍රේණිය)

සුදුසුකම් :
1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) විභාගය සම්මාන සමාර්ථ (C) දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත් වීම.

වයස් සීමාව :
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

සටහන :-
(a) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(b) තනතුරේ රාජකාරී මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(c) විශිෂ්ට සදාචාර සම්පන්න චරිතයකින් යුක්ත විය යුතුය.

වැටුප් ක්‍රමය :
U-PL 1 (III) රු. 42,775 - 16 x 450 - 49,975 (මාසිකව)
(ඉහත වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 අනුව වැටුප් පරිමාණය වේ. මූලික වැටුපට අමතරව රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ)

බඳවා ගනු ලබන ආකාරය :
වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින්

අමතර කුසලතා :
- ඉංග්‍රිසි භාෂාව පිළිබඳ ප්‍රමාණාත්මක දැනුමක්
- තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රමාණාත්මක දැනුමක්

### අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය

වැඩි විස්තර සහිත දැන්වීම සහ අයදුම්පත් ආයතනයේ නිල වෙබ් අඩවියට (pglpbs.kln.ac.lk) පිවිසීමෙන් ලබාගත හැකිය. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර 2026 පෙබරවාරි මස 20 දින හෝ ඊට පෙර හෝ ලැබෙන පරිදි නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අනධ්‍යයන අංශය, 977/5 යුනිවර්සිටි ඩ්‍රයිව්, බුළුගහ හන්දිය, නුවර පාර, කැලණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම් කිරීමට පෙර ඉහත සඳහන් ආයතනයේ නිල වෙබ් අඩවියේ පළකර ඇති සම්පූර්ණ විස්තරය සහිත දැන්වීම හොඳින් කියවා බලා අයදුම් කළයුතු බව සියලු අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් ඔවුන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය ආයතනය සතුය. එසේම ඉහත තනතුරු සියල්ලම හෝ ඉන් එකක් හෝ එකකට වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීමේ හෝ නොගැනීමේ හෝ තීරණය ආයතනය සතු වේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ, අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අයදුම්පත් කිසිදු හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය
977/5 යුනිවර් සිටි ඩ්‍රයිව් බුළුගහ හන්දිය,
නුවර පාර, කැලණිය

2026.02.06